# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2078/44 - 2018 ජූලි මස 04 වැනි බදාදා - 2018.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

*යොමු අංකය* : නුඑ/3/1/8/අත්පත්/111/52.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/**12**/**201**3/සීර්බි/31.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිඹුල කෝරළයේ සුලු කොට්ඨාසයේ තලවාකැලේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 330605 හා 2018.02.20 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 278 සිට 283 ලෙස පෙන්නුම් කර ඇති මුලු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.7444 ක් පමණ වන ඉඩම් කොටස්.

උපලේඛනය

01. **කැබලි අංක 278**
ඉඩමේ නම: හොලිරූඩ් වත්ත; විස්තරය: ඉදිකර ඇති පඩිපෙළ; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රධාන විධායක නිලධාරි, තලවාකැලේ වැවිලි සමාගම,අංක 25,ෆොස්ටර් වීදිය,කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0074.

02. **කැබලි අංකය 279**
ඉඩමේ නම: හොලිරූඩ් වත්ත; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රධාන විධායක නිලධාරි, තලවාකැලේ වැවිලි සමාගම,අංක 25,ෆොස්ටර් වීදිය,කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3922.

03. **කැබලි අංකය 280**
ඉඩමේ නම: හොලිරූඩ් වත්ත; විස්තරය: ස්ථිර ගොඩනැගිලි 16කින් ද තාවකාලික ගොඩනැගිලි 2 ක් සමන්විතය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රධාන විධායක නිලධාරි, තලවාකැලේ වැවිලි සමාගම,අංක 25,ෆොස්ටර් වීදිය,කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.7800.

04. **කැබලි අංකය 281**
ඉඩමේ නම: හොලිරූඩ් වත්ත; විස්තරය: කැළය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රධාන විධායක නිලධාරි, තලවාකැලේ වැවිලි සමාගම,අංක 25,ෆොස්ටර් වීදිය,කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4400.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A – G 028009 - 27 (2018/07)

05. **කැබලි අංකය 282**
ඉඩමේ නම: හොලිරූඩ් වත්ත; විස්තරය: ස්ථිර ගොඩනැගිලි 19 කින් සමන්විතය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රධාන විධායක නිලධාරි, තලවාකැලේ වැවිලි සමාගම,අංක 25,ෆොස්ටර් වීදිය,කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 1.1224.

06. **කැබලි අංකය 283**
ඉඩමේ නම: හොලිරූඩ් වත්ත; විස්තරය: ඉදිකර ඇති පඩිපෙල; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රධාන විධායක නිලධාරි, තලවාකැලේ වැවිලි සමාගම,අංක 25,ෆොස්ටර් වීදිය,කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0024.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 ජූලි මස 25 වැනි දින පෙ.ව. 10.00 ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2018.07.20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2018 ජුනි මස 25 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-598

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.